**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**
**පුරප්පාඩු**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදාහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

**<u>සාමාන්‍යාධිකාරි - (HM 2.1) – (Chief Operating Officer)</u>**

**<u>සුදුසුකම්</u>**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේ දී, ව්‍යාපාර පරිපාලනය , වාණිජ්‍ය යන ක්ෂේත්‍රයන් පිළිබඳව ලබාගත් ප්‍රථම උපාධිය **<u>හෝ</u>** මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වෙනත් උපාධියක් ලබා තිබීම.

   සහ

   ඉහත ක්ෂේත්‍රයන්ට අදාළව ලබාගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම **<u>හෝ පිළිගත්</u>** වරලත් වෘත්තිය ආයතනයක ඉහත විෂය ක්ෂේත්‍රයක සාමාජිකත්වය

   සහ

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසර 03 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ඇතුළුව වසර 15 ක කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේ දී, ව්‍යාපාර පරිපාලනය , වාණිජ්‍ය යන ක්ෂේත්‍රයන් පිළිබඳව ලබාගත් ප්‍රථම උපාධිය **<u>හෝ</u>** ඉහත තනතුරට අදාළ උපාධියක් ලබා තිබීම

   සහ

   ඉහත ක්ෂේත්‍රයන්ට අදාළව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම

   සහ

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමණකරණ මට්ටමේ තනතුරක අවුරුදු 3ක පළපුරුද්ද ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. 114, 560/- 12 × 3375- 155,060/-
(දළ මාසික වේතනය රු. 238,436/- ක් පමණ වනු ඇත)

වයස් සීමාව : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතු ය.

ii. තනතුරේ රාජකාරි නිසියාකාරව කිරීමට අවශ්‍ය කායික හා මානසික ශක්තිය තිබිය යුතුය.

iii. සුපිලිපන් චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

තෝරා ගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සුබසාධන ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයාට හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය සහ රජයේ චක්‍ර ලේඛනවලට අනුකූල වන පරිදි සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන වාහනයක් සහ මාසික ඉන්ධන දීමනා ඇතුළත්ව ආකර්ශනීය ප්‍රතිලාභ රැසක් හිමි වේ.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ ජීව දත්ත මග අයදුම්පතෙහි**,** වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවා යෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුළත් කොට **ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය. අදාළ සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

රජයේ /රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. **අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.**

**පොදු කොන්දේසි :**

1. අයදුම්පත් බාර ගන්නා අවසන් දිනය වන **2026.07.20 හෝ ඊට ප්‍රථම** සියළු අයදුම්කරුවන් විසින් උක්ත සඳහන් කර ඇති බඳවා ගැනීමට අදාළ සියළුම සුදුසුකම් නිසි ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

2. සෑම අයදුම්කරුවකුම විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. අයදුම්පතෙහි සපයා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සම්පූර්ණ බවට අයදුම්කරු විසින් සහතික විය යුතුය .

4. ඉහත ක්‍රම වේදයෙන් බැහැරව යොමු කරනු ලබන සෑම අයදුම්පතක්ම ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.

5. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අයදුම්පත් කැඳවීමෙන් පසුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා අයදුම්කරු පෙනී සිටිය යුතුය.

6. මෙම නිවේදනයේ ඇතුළත් නොවන යම් කරුණක් හෝ බඳවා ගැනීමේ ක්‍රියවලියේ දී පැන නගින ඕනෑම ගැටලුවක් සම්බන්ධයෙන් අවසාන තීරණය ගනු ලබන්නේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. තවද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අවසාන තීරණය වනු ඇත.

**සියලුම අයදුම්පත් 2026.07.20 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.**


**සභාපති**
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,
"මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41,
කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන අංකය 0112 320356 -9